**2019.03.10 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1984.05.01**

**සුන්දරත්වය ඇත්තේ ව්‍යාප්තියේ සාරය තුලයි.**

බාප්දාදා ව්‍යාප්තියත් එම ව්‍යාප්තියේ සාරය ලෙසින් සිබිනා දරුවන්වත් දකිනවා. මෙම දේව ගසෙහි සුන්දරත්වය ව්‍යාප්තියයි. එම ගසෙහි ඵල ද සිබින්නේ සාරය විලසින් සිබිනා දරුවනුයි. ව්‍යාප්තිය සෑම විටම විවිධ ස්වරූපයන්ගෙන් ඇත. එම විවිධත්වයේ සුන්දරත්වය දැකීමට සෑම කෙනෙක්ම කැමතියි. ගසෙහි අලංකාරය අනිවාර්යෙන්ම එහි සැරසිලියි. නමුත් වඩාත් බලගතු වන්නේ සාරය ස්වරූපයෙන් ඇති එහි ඵලයි. ව්‍යාප්තිය දැකීමට ඔබ කොයි වෙලේත් කැමතියි. නමුත් ඵලය දුටු විට නිරන්තරයෙන් බලවත්ව සිබිරේ බලාපොරොත්තුවත් ඇති වෙනවා. බාප්දාදාත් ව්‍යාප්තිය තුල ඇති සාරය දෙස බලනවා. ව්‍යාප්තිය අතර මැද්දේ ඇති සාරය හරිම ලස්සනට පෙනෙනවා. ඔබ සෑම කෙනෙක්ම මෙය අත්දැක තිබෙනවා. සාරයේ ප්‍රතිශතයත් ව්‍යාප්තියේ ප්‍රතිශතයත් අතර විශාල වෙනසක් තිබෙනවා. ඔබත් මෙය දන්නවා නේද ?ව්‍යාප්තියේ විශේෂත්වය එයටම ආවේණික වනඅතර එම ව්‍යාප්තියත් අවශ්‍යයි. නමුත් එහි සාරය වශයෙන් පෙනෙන්නට තිබෙන්නේ ඵලයි. මෙන්න රේ නිසා තමයි බාප්දාදා රේ දෙකම දැකීමට කැමති. ව්‍යාප්තිය වෙන ගසේ කොළ වලට ඔහු කැමති වගේම මල් හා ඵල වලටත් කැමතියි. මෙන්න රේ නිසා තමයි මෙහි පැමිණ ඔබ මුණගැසීමට බාප්දාදාටත් සේවකයෙක් විය යුතුවන්නේ. ඔහුත් ඔබ වගේම වුණේ නැතිනරි මෙම භෞතික ස්වරූපයේ දී හමුදමක් සිදුවන්නේ නැහැ. ව්‍යාප්තියේ ජීවාත්මයත් වුවත් සාරය ස්වරූපයෙන් සිබිනා ජීවාත්මයත් වුවත් ඔබ දෙගොල්ලන්ම පරමාත්ම පියාට අයිතියි. එනරි, දෙගොල්ලන්ම ඔහුගේ දරුවන් බවට පත්ව ඇත. මෙන්න රේ නිසා තමයි තමාව මුණගැසීමට ආසාවෙන් සිබිනා දරුවන්ගේ එම ආසාවේ ඵලය දීමට පරමාත්ම පියාට සිදුවන්නේ. භක්තිවන්තයින් අනිවාර්යෙන්ම තම භක්තියේ තාවකාලික ඵලය ලබනා නිසා, ඔය දරුවනුත් අනිවාර්යෙන්ම තම අයිතිය දිනාගත යුතුයි.

අද බාබා පැමිණ සිටින්නේ මුරලිය දීමට නොවෙයි. ඔබ සෑම කෙනෙක්ම දුර ඈත සිට පැමිණ සිටිනවා. එමනිසා මෙම හමුවීමේ පොරොන්දුව ඉටු කිරීමට බාබා පැමිණිය යුතු වෙනවා. ඇතැම් අය සෙනෙහසින්ම පියාව මුණ ගැසෙනා අතර තවත් පිරිසක් ඥානයෙන් මුණගැසෙද්දී තවත් පිරිසක් සම වීමේ ස්වරූපයෙන් මුණගැසෙනවා. කෙසේවෙතත්, පරමාත්ම පියා අනිවාර්යෙන්ම සෑම කෙනෙක්වම මුණගැසිය යුතුයි. අද දින, බාබා සෑම තැනකින්ම පැමිණ සිටිනා සෑම දරුවෙකුගේම විශේෂත්වයන් දෙස බලමින් සිටියා. පළමුව, බාබා බැලුවේ දිල්ලියේ විශේෂත්වයයි. සේවය ආරම්භවුණු තැන එයයි. ඒ ආරම්භයේ දීත් සේවයට මුල පිරීමට ඔබ යමුනා නදී ඉවුරම තෝරා ගත්තා. යමුනා නදී ඉවුරේ ඔබලා සේවය කළ නේද ? සේවයේ මුල් බීජ වැපිරුවේ දිල්ලි නුවර යමුනා නදී ඉවුරේ සිටයි. ඉතින් එමනිසා අධිරාජ්‍යයේ මාළිගාවත් පිහිටන්නේ යමුනා නදී ඉවුරේයි. මෙන්න මේ නිසා තමයි, ගොපිවල්ලභ හා (ගොපළු ගොපලියන්ගේ පියා) ගොපළු ගොපලියනුත් සමග යමුනා නදී ඉවුර ගැනත් සිහිකෙරෙන්නේ. ස්ථාපනයේ බලගතු දරුවන්ගේ TV එක දිහා බාප්දාදා බලාගෙන සිටියා. දිල්ලියේ අයට වත්මනත් අනාගතයේත් විශේෂත්වය තිබෙනවා. සේවය පදනම වුයේත් අධිරාජ්‍යයට පදනම වුයේත් එම තැනමයි. ඔය පදනම් වැසියන් හරිම බලගතුයි. නිතරම බලගතුව සිටීමේ වගකීම දිල්ලියේ අයට තිබෙනවා. දිල්ලියෙ සිටිනා ඔය උපකරණ ජීවාත්මයන් නිතරම මෙම වගකීමේ කිරුළ පළඳාගෙනයි සිටින්නේ, එහෙම නේද ? ඇතැම් විට ඔබ එම කිරුළ ගලවාගන්නේ නැහැ නේද ? දිල්ලියේ වැසියෙක් වෙනවා යනු නිරන්තරයෙන් වගකීමේ කිරුළ පළඳාගෙන සිටින්නෙක් බවට පත්වීමයි. දිල්ලි වැසියෙක් වීමේ විශේෂත්වය ගැන ඔබට තේරෙනවා ද ? නිරන්තරයෙන් මෙම විශේෂත්වය ක්‍රියාවට ගෙන එන්න. අච්චා.

බොහෝ කාලයක් තිස්සේ නැතිව සිට මේ දැන් හමුවුණු අනිත් පිරිසනම් කර්ණාටකයේ අයයි. ඔවුන් ඉතාමත් හොඳ බැතිබර හා කරුණා සෙනෙහසේ ගී ගයනවා. එක් පැත්තකින් මහා ගැඹුරු ශ්‍රද්ධා භක්තියෙන් පිරි බැති ගී ගයනා අතර ඔවුන් ඉතාමත්ම ආදරණීය ජීවාත්මයනුත් වෙනවා. ඒ වගේම අනිත් පැත්තෙන් අද ලෝකයේ හැටියට, ඉතාමත් ප්‍රසිද්ධ, උගත් පිරිසකුත් කර්ණාටකයේ සිටිනවා. ඉතින් ආදරභක්තියෙන් පිරි අයත් නිළතල හිමි අයත් දෙගොල්ලන්ම සිටිනවා. එමනිසා, කර්ණාටකයේ හඬ පැතිරී යා හැකියි. එම දේශය විශාල හඬක් පතුරුවනා දේශයකි. මන්ද *VIP* ජීවාත්මයන් පවා භූමියේ සෙනෙහස හා ශ්‍රද්ධාවෙන් සැදුණු නිහතමානී අය නිසා ඔවුන්ටත් ඉතාමත් පහසුවෙන් උපකරණ බවට පත් විය හැකියි. මෙම සුවිශේෂී කාර්යභාරයට කර්ණාටක දේශය උපකරණ වෙනවා. ඔබගේ ආදරබර නිහතාමානී විශේෂත්වය සෑම විටම ළඟ තබා ගෙන සේවය කරන්න. කුමනාකාරයේ වාතාවරණයක් උදාවුණත් මෙම විශේෂත්වය අතහරින්න එපා. ඒමම කාරණා දෙක තමයි කර්ණාටක බෝට්ටුවේ හබල දෙක වන්නේ. ඒම් දෙකම නිතරම එකලහින් තමාලඟ තබා ගන්න. එකක් ඉදිරියෙන් අනික පිටුපසින් නොවෙයි. එවිට සේවා බෝට්ටුව සාර්ථකත්වය පෙන්නුම් කරාවි. ඒමම දෙකෙහි සමබරතාවය ඔබගේ නම කීර්තිමත් කරාවි. අච්චා.

නිරන්තරයෙන් තමාව සාරයේ ස්වරූපයක් කරගන්නා අයව, සාරයේ තත්ත්වයේ ස්ථාවරවම සිටින්න්ව හා අන් අයවත් එසේ ස්ථාවර කරවන්නන්වත්, නිරන්තරයෙන් බලවත්ව සිටිනා ජීවාත්මයනුත්, මහා බලගතු ස්මරණයේ ප්‍රතිමූර්ති සේවාකරුවන්වත්, සම වීමෙන් හමුව සමරනා උතුම් ජීවාත්මයන්වත් සෙනෙහසින් සිහිපත් කර බාප්දාදා නමස්තේ කියයි.

**පරමාත්ම දෙවියන්ගේ පළමු උතුම් නිර්මාණය බ්‍රහමින්වරුනුයි – 84.05.03**

අද දින, පරමාත්ම පියා, නිර්මාණකරු, තම නිර්මාණය දෙස, එනම්, බ්‍රහමින් ජීවාත්ම දෙස පළමුවෙන් බලමින් සිටිනවා. ඔය උසස් බ්‍රාහ්මණ ජීවාත්ම පළමු උතුම් නිර්මාණය වන අතර එම නිසාම අන් අයට වඩා මහත් සෙනෙහසට ලක්වුවන් ද වේ. බ්‍රහ්මාගේ කටින් උපන් උසස්ම නිර්මාණය වන්නේ ඔය මුඛයෙන්උපන් දරුවනුයි , ඔය උසස් බ්‍රාහ්මන ජීවාත්මයනුයි. බ්‍රාහ්මණ ජීවාත්මයන්ගේ ගුණ වර්ණනාව වන්නේ ඔවුන් දේවතා ජීවාත්මයන්ටත් වඩා උසස් අය ලෙසිනුයි. බ්‍රහමින් තත්ත්වයෙන් පසුව ඉටු දේවතා බවටත් ඉන් අනතුරුව දේවතාවරුන් බවටත් පත් වන්නේ මෙම බ්‍රාහ්මණ ජීවාත්මයනුයි. කෙසේවෙතත්, ආදි පිතා ගෙන් බිහිවන පළමු සංගම යුගි ජීවිතය වන්නේ බ්‍රාහ්මන දිවියයි. සංගම යුගයේ පළමු වැසියන් වන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි: ඔවුන් ඥාන ප්‍රතිමූර්තීන්ය, ත්‍රිකාලදර්ෂී හා ත්‍රිනේත්‍රී වේ. භෞතික ලෝකයේ භෞතික ස්වරූපයෙන් පරමාත්ම ජීවයව මුණගැසෙනා ජීවාත්ම සත්තාවන් තම සෑම සබැඳියාවකින්ම සෙනෙහසේ වගකීම ඉටු වන බව හොඳින් අත්දකිනා අතර දේව සම්පත් සියල්ලට අයිතිවාසිකම් ද හිමිකරගනී. භෞතික ස්වරූපයෙන් බ්‍රහමින්වරුන් ගයනා ගීතය මෙයයි. "අප දුටුවා, බ්‍රහ්ම බාබාගෙන් අප ශිව් බාබාව ලැබුවා" යන්න දේවතා ජීවිතයේ ගීතය නොවෙයි. මෙම භෞතික ලෝකයේ තම පියවි ඇසින් පියවරුන් දෙදෙනාම දකින්න ලැබීම, ඔවුන් සමඟ කෑම ගැනීමට ලැබීම, ඇවිදින්නට යාම, ඔවුන් කියන දේ අසා ගෙන සිටින්නට, සෑම දිව්‍යමය ක්‍රියාවක්ම අත්දකින්න ලැබීම රූපයක් නැති කෙනාව දකින්න ලැබීම ආදි සියල්ලම මෙම බ්‍රහමින් ජීවිතයේ දී පමණක් ලැබෙනා උසස් වාසනාව වේ.

අපි පිය ස්වරූපයෙන් දෙවියන්ව දැක්කා කියා කියන්නේ බ්‍රහමින්වරුන් පමණයි. අපි ඔහුව මව, මිතුරා, සොහොයුරා හා මනාලයා යන ස්වරූප වලින් දැක්කා. ඍෂිවරුන්, මුණිවරයින්, තාපසයින් හා ආගමික පත පොත හැදෑරූ මහා පණ්ඩිතයින් පවා ගුණ ගී ගැයුවා. ඔවුන්ට දර්ශනයක බලාපොරොත්තුවක් දුන්නා : ඔහු ඒවි: අපි අනිවාර්යෙන්ම කවදා හෝ ඔහුව මුණ ගැසේවි. ඔහු මුණගැසීමේ බලාපොරොත්තුවෙන් ඔවුන් කල්පය වටා දිගටම ගියා. ඒ වුණත්, බ්‍රහමින් ජීවාත්ම මහා දිස්නයෙන්, ශ්‍රද්ධාවෙන්, කුල්මත්ව හා සතුටින් තම හදවතින්ම කියන්නේ තමන් තම පරමාත්ම පියාව ලද බවයි. ඒ අය පිපාසාවෙන් සිටිනා අතර ඔබලා හමුවක් සමරණා අයයි.

- බ්‍රාහ්මණ ජීවිතයක් ගත කරනවා යනු අවිනාශී, අපරිමිත, අචල හා ස්ථාවර ප්‍රාප්තීන් සම්භාරයකින් පිරි ජීවිතයක ප්‍රතිමූර්තියක් වීමයි.
- මෙම කල්ප ගසෙහි පදනම වන්නේ බ්‍රාහ්මණ ජීවිතයයි : එය මූල්‍ය.
- මෙම ගස වර්ධනය වන්නේ බ්‍රාහ්මණ ජීවිතය මතයි.
- මුලු ජීවාත්ම සංහතියම මුක්තියේ හා ජීවන මුක්තියේ ප්‍රාප්තීන් බීජයෙන් ලබන්නේ බ්‍රාහ්මණ දිවිය නම් වූ මුල් මඟිනි.
- අතු රිකිලි පවා වැඩෙන්නේ බ්‍රාහ්මණ දිවියේ ආධාරය මතයි.
- ඉතින් එමනිසා බ්‍රාහ්මණ ජීවාත්මයන් නොයෙකුත් වර්ගයේ වංශ පරම්පරාවන්ගේ නැංගුරම වේ.
- මුලු ලෝකයේම අති උතුම් වූ නවීකරණ කාර්යයේ දොරටු විවර කරන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- ඥාන යාගය නම් වූ අශ්ව බිලි පූජාව ස්ව අධිකාරිත්වය වෙනුවෙන් බිල්ලට දෙන මහා යාගය නිර්මාණය කරනා උතුම් ජීවාත්මයන් වන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- සෑම ජීවාත්මයකම උපත් 84 හඳහන දන්නා අය බ්‍රාහ්මණ ජීවාත්මයන් වේ.
- සෑම ජීවාත්මයකගේම උසස් වාසනාවේ රේඛාව භාග්‍යය දානය කරන්නා අතින්ම අඳවනා පිරිස වන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- මුක්තිය හා ජීවන මුක්තිය වෙතට යන්නා වූ මහා වන්දනා ගමනේ සෑම ජීවාත්මයක්ම කැන්දාගෙන යන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- සෑම ජීවාත්මයක්ම එකට එකතු කරවා පරමාත්ම පියාට බැන්ද වීමේ ගිවිසුම සිදු කරන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයන් විසිනි.
- තම හස්තය දෙවියන්ගේ හස්තය මත තැබීමේ බන්ධනය බඳින්නෝ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- උපතක් උපතක් පාසා අඛණ්ඩ පාරිශුද්ධත්වයක බන්ධනය බඳිනා අය වන්නේ බ්‍රාහ්මණ ජීවාත්මයනුයි.
- බ්‍රහ්මණ ජීවාත්මයන් අමරණීයත්වයේ කතාන්දරය පවසා සෑම කෙනෙක්වම අමරණීය කරවයි.

ඔය ජීවාත්මයන් කෙතරම් උසස් ද කෙතරම් විශාල වගකීමක් දරණ පිරිසක්දැයි කියා ඔබලාට තේරෙනවා ද ? ඔබලා ආදිතමයින් වේ. ආදිතමයින් කෙසේ වේ ද ඔවුන්ගෙන් පසුව එන වංශය ද ඒ ආකාරයේ වේ. ඔබලා සාමාන්‍ය අය නොවෙයි. ඔබලා වගකීම දරන්නේ ඔබගේ පවුලේ අයට හෝ සේවා ස්ථානයට පමණක් නොවෙයි. එවන් සීමිත තැනකට පමණක් වගකීම දරණ අය නොවෙයි ඔබලා. ඔබලා මුලු ලෝකයටම සිටිනා ආධාරකයේ ප්‍රතිමූර්තීන්ය, ඉහළට නැංවීමේ ප්‍රතිමූර්තීන්ය. සෑම බ්‍රාහ්මණ ජීවාත්මයකටම අසීමිත වගකීමක් ඇත. ඔබලා ඔබගේ අසීමිත වගකීම සම්පූර්ණ කළේ නැතිනම්, තමාගේ ලෞකික ගෘහ ජීවිතය හෝ අලෞකික ගෘහ ජීවිතය පමණක් බලාකියා ගනිමින් ඇතැම් විට පියාසර තත්ත්වය අත්විඳිමින්, ඇතැම් විට වර්ධනය විඳිමින්, ඇතැම් විට ඇවිදින ත්ත්වය විඳිමින්, ඇතැම් විට නැවතීමේ තත්ත්වය විඳිමින් යන්නේ නම් එවන් කෙනෙක් බ්‍රාහ්මණ ජීවාත්මයක් නොවෙයි, ඔවුන් ක්ෂත්‍රිය ජීවාත්මයන් වේ. එවන් ජීවාත්මයන්

නිරන්තරයෙන් "මම මේක කරන්නම්, මම අරක කරන්නම්" කිය කියා තම තමන්ගේ උත්සාහයේ අරුමය ගයමින් තමන්ගේ එල්ලය මතම එල්ලීමට උත්සාහ කරමින් සිටිනා පිරිසක් වේ. නිතර නිතර ඉලක්කය ඉලක්ක කරමින් සිටීමත් ඇත්තටම ඉලක්කයට වැදීමටම ගැහීමත් කියන දෙක අතර වෙනසක් තිබෙනවා. ඔවුන් කරන්නේ නිතර නිතර ඉලක්ක කරමින් සිටීම පමණයි. "මම මේක කරන්නම්, මේක මේ විදියට කරන්නම්" කිය කියාම පමණක් සිටිනවා. ඔවුන් නිතරම ඒ ආකාරයෙන් තම අරමුණට ලඟා වීමට උත්සාහ දරමින් සිටිනවා. එවන් ජීවාත්මයන්ව හඳුන්වන්නේ ක්ෂත්‍රිය ජීවාත්මයන් ලෙසිනුයි. බ්‍රාහ්මණ ජීවාත්මයන් ඉලක්කය එල්ලක කර ගැනීමට උත්සාහ දරමින් සිටිනා අය නොවෙයි; ඔවුන් නිතරම ඉලක්කය මතම සිටින්නෝ වෙති. ඔවුන් ගේ සිහියේ නිතරම තමාගේ ඉලක්කය හොඳින් තිබෙනවා. එක් තත්පරයක සිතිවිල්ලෙන් ඔවුන් ජයග්‍රහණය ලබනවා. බාප්දාදා නිතරම බ්‍රාහ්මණ දරුවන්ගේත් ක්ෂත්‍රිය දරුවන්ගේත් සෙල්ලම දෙස බලමින් සිටිනවා. බ්‍රහමින් වරුන්ගේ සෙල්ලම ජයග්‍රහණයම වන අතර ක්ෂත්‍රියයින් නිතරම දුන්න හා ඊතලයේ බර කරේ තබාගෙන යන්නෝ වෙති. ඔවුන්ගේත උත්සාහයේ නිරන්තරයෙන් ඇත්තේ වෙහෙසේ දුන්නයි. ඔවුන්, එක් ප්‍රශ්නයක් ඉවර කර ගත් සැනෙකින් තවත් එකක් ඉස්මතු වේ. බ්‍රහමින්වරුන් විසඳුම් ප්‍රතිමූර්තීන් වේ. ක්ෂත්‍රියයින් නිතරම ප්‍රශ්නයකට පිළිතුර සොය සොයා සිටින්නෝ වෙති. භෞතික ස්වරූපයේ දී බාබා ඔබට ලස්සන කතාවක් කිය කියා සිටියා : ක්ෂත්‍රියයින් කරන්නේ කුමක් ද ? මේ ගැන කතාන්දරයක් තිබෙනවා – මීයාව නැති කළ විට පූසා ආවා. අද මුදල් ප්‍රශ්නයක්, හෙට හිතේ ප්‍රශ්නයක්, අනිද්දාට ඇඟේ ප්‍රශ්නයක් නැතිනම් නෑදෑයින්ගෙන් ප්‍රශ්නයක්. ඔවුන් නිතරම උත්සාහ කරමින්ම සිටිනවා. ඔවුන් අනිවාර්යෙන්ම තමන් ගැන හෝ අනිත් අය ගැන මැසිවිල්ලකින්මයි සිටින්නේ. දරුවන් මෙසේ කුමන හෝ කාරණයක් ගැන විටින් විට උත්සාහ දරමින් සිටිනා ආකාරය දකිනා විට බාප්දාදාට තම කරුණාබර මෛත්‍රියෙන් දැනෙන්නේ මහා කරුණාවක්.

සංගම යුගයේ බ්‍රහමින් ජීවිතය යනු හද සනසන්නාගේ හදවතේ විවේක සුවයෙන් සිටීමට ඇති කාලයයි. ඔහුගේ හදවතේ සැපට සිටින්න. බ්‍රහ්ම භෝජන අනුභව කර ඥාන පැණිය පානය කරන්න. බලගතු සේවාවක් කර සැප වින්දනයෙන් හද සිහසුනේ අසුන් ගන්න. ඇයි ඔබ කලබල වන්නේ ? ඔබලා දැන් තව දුරටත් දුක් බර වේදනාවෙන් ඔහෝ රාමා කියන්නේ නැහැ නේද ? නැතිනම්, ඕ බාබා, ඕ දාදී, ඕ දීදී කියනවා ද ? අනේ බාබා, අනේ දාදී, දීදී මට ඇහුම් කන් දෙන්න, මොනවා හෝ කරන්න, කිය කියා කියනවා නම් එය කලබලයෙන් පීඩා විඳීමයි. මෙය සුවයෙන් සිටීමට ඇති යුගයයි. ආධ්‍යාත්මික වින්දනයේ සිටින්න. මෙම ලස්සන දවස් ආධ්‍යාත්මික වින්දනයෙන් ගෙවන්න. විනාශ වන දේ මතම වින්දනය තබා ගන්න එපා. ගී ගයා නටන්න, නමුත් පරල වන්න එපා. දැන් මේ කාලයේ දේව වින්දනය ඔබ වින්දේ නැතිනම්, ආයි කවදා විඳින්න ද ? ඔබගේ ආධ්‍යාත්මික ගරුත්වයේ අසුන් ගන්න. ඇයි ඔබලා වෙහෙසට පත් වන්නේ ? කුඹියෙක් තරම් කුඩා දෙයක් ඔබගේ බුද්ධිය ගොස් ඔබගේ බුද්ධි යෝගාව බිඳවනා ආකාරය දැක පියා පුදුම වෙනවා. කුඹියෙක් ඔබව භෞතිකව සපා කැවොත් එතැන ගල් ගැසෙන්නාක් සේ අර කුඩා සිදුවීමත් ඔබගේ සිහිය විකල් කරවනවා. අලියෙකුගේ කණට කුඹියෙක් රිංගුවොත් අලියා සිහි විකල් වෙනවා. ඒ ලෙසින්ම, බ්‍රාහ්මණ ජීවාත්මයනුත් සිහි විකල් වී ක්ෂත්‍රියයන් බවට පත් වෙනවා. තමන් කරන සෙල්ලම් ගැන දැන් ඔබට පැහැදිලි ද ? ක්ෂත්‍රියයන් වෙන්න එපා. එසේ වුවහොත් ඔබලා ලබන්නේ රිදී යුග රාජ්‍යයයි. ස්වර්ණම යුග දේවතාවරුන් නොකා ඉවත් කරනා දෙය ලබන්නේ රිදී යුගයේ ක්ෂත්‍රියයන් වේ. කර්ම ක්ෂේත්‍රයේ පළමු අස්වැන්න ලද යුත්තේ දේවතාවරුන් වීමට සිටිනා බ්‍රහමින්වරුනුයි, ක්ෂත්‍රියයන් ලබන්නේ දෙවන භාගයයි. පළමු අස්වැන්නේත් දෙවන අස්වැන්නේත් රසය වෙනස් බව ඔබලා දන්නවා නේද ? අච්චා.

**මහාරාෂ්ට්‍ර හා උත්තර් ප්‍රදේෂ් පිරිස:** මහාරාෂ්ට්‍රාවේ විශේෂත්වයක් ඇත. මහාරාෂ්ට්‍ර යන නමේ තේරුමෙන්ම, ඔවුන් මහා ජීවාත්මයන්ගෙන් සැදි මල් කලබක් බාප්දාදාට ප්‍රදානය කරයි. මහාරාෂට්‍ර රාජ්‍යය හරිම ලස්සනයි, පූර්ණයි. ඉතින් එවන් පූර්ණ, ප්‍රසිද්ධ ජීවාත්මයන්ව මහාරාෂ්ට්‍රාව ගෙන ආ යුතුයි. මෙන්න මේ නිසා තමයි, ජීවාත්මයන්ව උතුම් අය බවට පත් කරවා ලස්සන ජීව කලබක් බාබාට ගෙන එන්න කියා ඔබලාට කියා තිබෙන්නේ. දැන් මෙම අවසාන කාලයේ දී ඒ මහා ධනස්කන්ධ හිමි අයටත් චරිත කොටසක් තිබෙනවා. ඔබත් සමග සම්බන්ධ වීමේ චරිතය ඔවුනට නැහැ, නමුත් ඇසුරේ සිටිනවා. තේරුණා ද ?

උත්තර ප්‍රදේශයේ ටජ් මහල, ලෝක පුදුමයන්ගෙන් එකක් වන දෙස් විදෙස් සැවොම දන්නා දේ තිබෙනවා. ලෝකයේ පුදුම දේ යූපී වල තිබෙන්නාක් සේ එහි සිටිනා අයත් සේවාවේ ඉතාමත් හොඳ ප්‍රායෝගික අරුම පුදුම ඵල ගෙනහැර පෙන්නන් වෙනවා. එම නිසා කිසියම් අපූරු දෙයක් කිරීමේ අය, ලෝකයේ සිටිනා අපූරු අය කියා ඔබලාත් බ්‍රාහ්මණ ලෝකය තුළ සුප්‍රසිද්ධ වී තිබෙනවා. ?එවන් අපූරු කාර්යයක් ඔබ කළ යුතුයි. නිකම් ගීතා පාඨශාලා හෝ මධ්‍යස්ථාන පමණක් දැමීම අපූරු දෙයක් වන්නේ නැහැ. වෙන කිසිම කෙනෙක් තවමත් කර නොමැති දෙයක් කලහොත් පමණයි, එය අපූරු දෙයක් කියා කියන්නේ. ඔබට තේරුණා ද ? පිටරට වල අයත් සෑම වාරයකදීම පැමිණෙනවා. ඔවුන් තමන්ගේ පහසුකම් වලින් පියවරුන් දෙදෙනාව ලෝකය පුරා සිටින්නන් බවට පත් කරවනවා. ලෝකය පුරා සිටිනවා යනු තම පියව් ඇසින් ඔවුන්ට දැක බලා ගත හැකි වේවි. ඉතින් ඔවලා එවන් පියෙක්ව ලෝකය ඉදිරියේ සිටින්නෙක් බවට පත් කරවනවා. තමන් කළ යුත්තේ කුමක්ද කියා විදේශීය අයට තේරෙනවා ද ? අච්චා. හෙට මුලු කණ්ඩායමම ආපසු යනවා. ක්‍රම ක්‍රමයෙන්, හෙලිකොප්ටර පවා මෙහි සැපත් වන කාලයක් ඒවි. ඔබ වෙනුවෙන් සෑම පහසුකමක්ම සූදානම් කර තිබෙනවා. ස්වර්ණමය යුගයේ විමාන පේලියක් තිබෙන්නාක් සේ, දැන් මෙහි ජීප් , බස් පේලියක් තිබෙනවා. තව ටික දවසකින් විමාන පේලියකුත් ඒවි. සෑම කෙනෙක්ම බිය වී මෙහි දුවගෙන ඒවි. ඔබලාට හැමදෙයක්ම දී ඔවුන් යන්න යාවි. ඔවුන් බයෙන් සිටිනා අතර ඔබලා පියාබා යාවි. ඔබලාට මරණ බයක් නැහැ. ඔබලා දැනටමත් මැරිලා. එහි ආදර්ශයක් ඔබලා පාකිස්තානයේ දී දැක්කා. ඒ සෑම කෙනෙක්ම තම තමන්ගේ යතුරු දමා යන්න ගියා. ඒනිසා ඒ සෑම යතුරක්ම ලබන්න සිටින්නේ ඔබලා යි. ඔබට කරන්න තිබෙන්නේ ඒවා බලා කියා ගැනීම පමණයි. අච්චා.

බ්‍රාහ්මණ ජීවිතයේ සෑම විශේෂත්වයක්ම තම ජීවිතයට ගෙන එන, භෞතික විවේකය පමණක් නොව ආධ්‍යාත්මික වින්දනය හා ආධ්‍යාත්මික සුවය හද සනසනා පරම පිය හදවතින් විඳින, සංගම යුගයේ උසස් ගරුත්වය නිතරම රැක ගන්න, වෙහෙස සෙනෙහස බවට පත් වන ආකාරයෙන් සෙනෙහසේ ගැලී සිටින, එවන් උතුම් බ්‍රාහ්මණ ජීවාත්ම සත්තාවන්ට බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර නමස්තේ කියයි.

වරදානය: ඥාන මිණිමුතු ධාරණය කර ගනිමින් සියලු අපතකාරී දේ ඉවත ලන පූජනීය හංසයෙක් බවට ඔබ පත් වේවා.

හෝලි හංසයින්ට විශේෂතා දෙකක් ඇත. එකක් තෝරා බේරා ගැනීමේ බලයෙන් ඥාන මිණිමුතු අහුලා ගැනීම, අනෙක දියෙන් කිරි වෙන් කර ගැනීම. දියෙන් වෙන් කර ගන්නවා යනු අපතකාරී දේ හා බලගතු දේ වෙන වෙනම හඳුනා ගැනීමයි. අපතකාරී දේ වතුර හා සම වන අතර බලගතු දේ කිරි හා සම වේ. ඉතින් එමනිසා අපතකාරී දේ ඉවතලනවා යනු පූජනීය හංසයෙක් වීමයි. නිරන්තරයෙන් ඥාන මිණිමුතු ඔබගේ සෑම මොහොතකදීම ඔබගේ සිහියේ තබා ගන්න. ඔබගේ එම ආවර්ජණය දිගටම පවතින විට ඔබලා මුතු මැණික් වලින් පිරි අය වේවි.

පාඨය : තම උසස් තිලය මත නිරන්තරයෙන් ස්ථාවරව සිටිමින් සියලු විරෝධතා බැහැර කරන්නෝ ජයග්‍රාහී ජීවාත්ම සත්තාවන් වේ.

***** ඕම් ශාන්ති*****